**<u>ජාතික කලාකරු හැඳුනුම්පත් ඉල්ලුම් කිරීම සම්බන්ධයෙන් වන සුදුසුකම් විස්තරය</u>**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් ජාතික මට්ටමේ කලාකරුවන් වෙත පිරිනමන කලාකරු හැඳුනුම්පත් සඳහා දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකින්ම අයදුම්පත් ලැබෙමින් පවතින අතර නන්විධ කලා ක්ෂේත්‍රයන්ට අයත් පහත සුදුසුකම් සපුරා ඇති කලාකරුවන්ට මෙම හැඳුනුම්පත ලබාදීමට කටයුතු කෙරේ.

මෙම අයදුම්පත් දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම්/අදාල සංස්කෘතික අංශ නිලධාරීන් සහ සංස්කෘතික බලමණ්ඩල යටතේ තෝරා ගැනෙන අතර නිශ්චිත සුදුසුකම් සපුරා ඇතිනම් පමණක් මේ සඳහා ඉල්ලුම් කළ යුතුයි.
මූලික සුදුසුකම්

- අවම වශයෙන් තමා නියැලි කලා ක්ෂේත්‍රයේ වසර 18 ක නිර්මාණකරනයේ අඛන්ඩ සේවා කාලයක් හෝ ජාතික හෝ ජාත්‍යාන්තර මට්ටමේ සම්මානයට, ඇගයීමට, ජයග්‍රහනයන්ට පාත්‍ර විය යුතුයි.

මෙම මූලික සුදුසුකම් සපුරා නොමැතිනම් තමා අයත් කලා ක්ෂේත්‍රයන්හී පහත සඳහන් අවම සුදුසුකම් ඉල්ලුම්කරුවන් විසින් සපුරා තිබීම සැලකිල්ලට ගනු ලැබේ.

ලේඛනය, ග්‍රන්ථකරණය, සංස්කරණය

- අවම වශයෙන් ග්‍රන්ථ 05ක් රචනය/ සංස්කරණය/පරිවර්තනය ආදී මගින් ප්‍රකාශයට පත්කොට තිබිය යුතු අතර ISBN/ISSN ලද කෘති විය යුතුයි
- ග්‍රන්ථ 05කට අඩු සංඛ්‍යාවක් ලියා පළකොට ඇත්නම් ඒ සඳහා රාජ්‍ය සාහිත්‍ය සම්මාන /ස්වර්ණ පුස්තක සම්මාන ලබා තිබිය යුතුයි.
- අවම වශයෙන් පුවත්පත් ලේඛනයේ හෝ විශේෂාංග කතුවරයකු වශයෙන් වසර 10 ක පළපුරුද්ද තිබිය යුතුයි. ( පුවත්පත් ආයතනයන්හි ප්‍රාදේශීය මාධ්‍යකරුවකු වීම මීට අදාල නොවේ)

නර්තනය /නර්තන රචනය හා වාදනය

- ජාතික මට්ටමේ සම්මාන සහතික හෝ ඇගයීම් ලබා තිබිම
- පාරම්පරික ගුරුකුලයකින් පැවත ඒන අදාල කලාවේ දස වසරක් නියැලි පුද්ගලයෙකු වීම
- කලායතනාධිපතිවරයකු/වරියක නම් කලායතන ලියාපදිංචියෙන් වසර 05 ක් සම්පූර්ණ කර තිබීම සහ පස් වසරක අඛණ්ඩ සේවා කාලය
- ජාතික හෝ ජාත්‍යාන්තර උත්සවාදියට සහභාගී වීම
- පුවත්පත් වාර්තා හා විශේෂාංග ලිපි මගින් ජාතික මට්ටමේ ශිල්පියෙකු බව සනාථ වීම

සංගීතය /ගායනය/ සංගීත අධ්‍යක්ෂණය හා වාදනය

- ජාතික මට්ටමේ සම්මාන සහතික හෝ ඇගයීම් ලබා තිබීම
- නිර්මාණකරණය- ගායනය හෝ සංගීත අධ්‍යක්ෂණයෙන් සංයුක්ත තැටියක්/කැසට් පටයක් ඵළි දක්වා තිබීම
- ගුවන් විදුලියේ ශ්‍රේණිගත ශිල්පියකු හෝ ශිල්පිනියක වීම සහ වසර 05 ක පළපුරුද්ද
- කලායතනාධිපතිවරයකු/වරියක නම් කලායතන ලියාපදිංචියෙන් වසර 05 ක් සම්පූර්ණ කර තිබීම සහ පස් වසරක අඛණ්ඩ සේවා කාලය
- වාදන ශිල්පියෙකු වශයෙන් රාජ්‍ය සංගීත කණ්ඩායම්/ත්‍රිවිධ හමුදා පොලිස් වාදක කණ්ඩායම් වල වසර 05 ක අඛණ්ඩ සේවා කාලය හෝ ලියාපදිංචි සංගීත කණ්ඩායමක වසර 15 ක අඛණ්ඩ සේවා කාලය (ලියවිලි මගින් සනාථ කළ යුතුයි)
- ජාතික හෝ ජාත්‍යාන්තර උත්සවාදියට සහභාගී වීම
- පුවත්පත් වාර්තා හා විශේෂාංග ලිපි මගින් ජාතික මට්ටමේ ශිල්පියකු බව සනාථ වීම

චිත්‍ර /මූර්ති/ග්‍රැෆික් නිර්මාණය/ පසුතල නිර්මාණ

- ජාතික මට්ටමේ සම්මාන සහතික හෝ ඇගයීම් ලබා තිබීම
- නිර්මාණකරණය-ජාතික මට්ටමේ නිර්මාණකරණය සඳහා සාක්ෂි සැපයිය යුතුයි.
- චිත්‍ර /මූර්ති/කැටයම් ආදී ප්‍රදර්ශන ජාතික හෝ ජාත්‍යාන්තර වශයෙන් පවත්වා තිබිම
- කලායතනාධිපතිවරයකු/වරියක නම් කලායතන ලියාපදිංචියෙන් වසර 05 ක් සම්පූර්ණ කර තිබිම සහ පස් වසරක අඛණ්ඩ සේවා කාලය
- පුවත්පත් වාර්තා හා විශේෂාංග ලිපි මගින් ජාතික මට්ටමේ ශිල්පියෙකු බව සනාථ වීම

නාට්‍යකරණය/අධ්‍යක්ෂණය/සහාය අධ්‍යක්ෂණය/අංගරචනය/පිටපත් රචනය

- ජාතික මට්ටමේ සම්මාන සහතික හෝ ඇගයීම් ලබා තිබීම
- ජාතික සම්මානයට හෝ ඇගයීමට පාත්‍ර නොවූයේ නම් තමා විසින් අවම වශයෙන් නාට්‍ය 05 ක් හෝ නිර්මාණනය කර වේදිකාගත කිරීම/අංගරචනය/පිටපත් රචනයෙන් දායක වී තිබීම
- නිර්මාණකරණය-ජාතික මට්ටමේ නිර්මාණකරණය සඳහා සාක්ෂි සැපයිය යුතුයි.
- තම නාට්‍ය ප්‍රදර්ශන ජාතික හෝ ජාත්‍යන්තර වශයෙන් දර්ශන වාර 10 කට නොඅඩු සංඛ්‍යාවක් වේදිකාගත කොට තිබීම
- වේදිකා නාට්‍ය /ටෙලි නාට්‍ය/ චිත්‍රපට/ කෙටි චිත්‍රපට/වාර්තා වැඩසටහන් 05 කට නොඅඩු සංඛ්‍යාවක් සඳහා දායක වීම
- කලායතනාධිපතිවරයකු/වරියක නම් කලායතන ලියාපදිංචියෙන් වසර 05 ක් සම්පූර්ණ කර තිබීම සහ පස් වසරක අඛණ්ඩ සේවා කාලය
- පුවත්පත් වාර්තා හා විශේෂාංග ලිපි මගින් ජාතික මට්ටමේ ශිල්පියෙකු බව සනාථ වීම

රංගනය/හඬකැවීම්/ නිවේදනය

- ජාතික මට්ටමේ සම්මාන සහතික හෝ ඇගයීම් ලබා තිබීම
- රූපවාහිනී ගුවන්විදුලි හෝ වේදිකා නාට්‍ය නිර්මාණ 05කට දායක වීම
- අවම වශයෙන් සිනමාපට 05 ක රංගන දායකත්වය
- රූපවාහිනී ගුවන්විදුලි ප්‍රවෘත්ති නිවේදනය/වාර්තාකරණය/පසුබිම් කථනය සඳහා වසර 05ක අඛණ්ඩ සේවා කාලයක් තහවුරු කිරීම
- විදේශීය නිර්මාණ කාර්යයන් සඳහා දායක වී තිබීම

කැමරාකරණය/කැමරා අධ්‍යක්ෂණය /ඡායාරූපකරණය

- ජාතික මට්ටමේ සම්මාන සහතික හෝ ඇගයීම් ලබා තිබීම
- රූපවාහිනී නිර්මාණ 10 නොඅඩු සංඛ්‍යාවක් හෝ සිනමා කෘති 05 කට නොඅඩු සංඛ්‍යාවක් සඳහා දායකත්වය දක්වා තිබීම
- අවම වශයෙන් තම ඡායාරූප ප්‍රදර්ශන 05 කට නොඅඩු සංඛ්‍යාවක් පැවැත්වීම
- පුවත්පත් වාර්තා හා විශේෂාංග ලිපි මගින් ජාතික මට්ටමේ ශිල්පියෙකු බව සනාථ වීම
- කලා නිර්මාණකරනයට දායක නොවන ඡායාරූප ශිල්පියකු මේ සඳහා අදාල නොවේ.

ඉහත කලා ක්ෂේත්‍ර කිහිපයකට අයත්වන්නකුගේ කලාකරු හැඳුනුම්පතේ තනතුරු නාමය, අයදුම්පතට අදාලව ඒය ජාතික කලාකරු හැඳුනුම්පතේ සටහන් කළ හැකි ඉඩකඩ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් කලා ක්ෂේත්‍ර ප්‍රමුඛතා පිළිවෙලට සටහන් කෙරෙනු ඇත.

කලාකරුවා විසින් මෑතකදී ගත් 2.5 cm × 3.5 cm ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ නොගැලවෙන සේ අමුණා ඒවිය යුතුයි.

තමා ජාතික මට්ටමේ කලාරුවකු බව සනාථ කිරීමටත් මෙම හැඳුනුම්පත ලැබීමට සුදුස්සකු බව සනාථ කිරීම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා අදාල සාක්ෂි ඇමුණුම් මගින් ලබාදීම අනිවාර්ය වේ.